Article 12(1).

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>**My No.** | ඔබේ අංකය<br>உமது இல.<br>**Your No.** | දිනය<br>திகதி<br>**Date** 2019-05-23 |

පැමිණිලිකරු : එච්.වී.ජ්. කුමාර මහතා,
අංක. 26/4, ඉහල රවුම් පාර,
දංගොල්ල, මහනුවර.

වගඋත්තරකරු : විදුහල්පති, - මහ/කිංස්වුඩ්/02/02/02/30
මහ/කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/K/661/16/I</u>**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින්, තමා 2017 වර්ෂයේ පළමු ශ්‍රේණියට තම දරුවා වන එච්.වී.එච්.ජ් කුමාර දරුවා ඇතුළත් කිරීම සඳහා මහ/කිංස්වුඩ් විද්‍යාලයට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ හා සහෝදර ගණය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කළ බවත්, සහෝදර ගණය යටතේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලකුණු 68 ක් ලබාගත් නමුත් ළමුන් තෝරාගත් නාමලේඛනයේ තම දරුවාගේ නම ඇතුළත් වී නොතිබූ බවත්, තමාගේ දරුවා ලකුණු 68 ක් ලබාගෙන තිබියදීත් ලේඛනයේ ඊට වඩා අඩු ලකුණු ලැබූවන් පොරොත්තු ලේඛනයට ඇතුළත්ව තිබූ බවත්, තම දරුවාගේ සහෝදරයින් තිදෙනාම කිංස්වුඩ් විද්‍යාලයේ ඉගෙනුම ලබන බවත්, තමා පදිංචි ස්ථානයට ආසන්නම ක්‍රිස්තියානි ධර්මය ඉගෙනීමට වෙනත් පාසලක් නොමැති බවත් සඳහන් කර ඇත.

මේ සම්බන්ධයෙන් තමා අභියාචනයක් ඉදිරිපත් කර අභියාචනා පරීක්ෂණ මණ්ඩලයට පෙනී සිටි නමුත් ලකුණුවල වෙනසක් සිදුනොවූ බවත්, නාම ලේඛනය ප්‍රදර්ශනයේදී තමාගේ නම ඉවත් කර ඇති බව දැක ගැනීමට හැකි වූ බවත්, තමාගේ ළමයා පාසලට ඇතුළත් කර නොගැනීමෙන් අභියාචනා මණ්ඩල නිළධාරීන් හා විදුහල්පති විසින් බලවත් අගතියක් සිදුකර ඇති බැවින් තම දරුවා කිංස්වුඩ් විද්‍යාලයට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින බවත් සඳහන් කර ඇත.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 165, කිංසි පාර, කොළඹ - 08.<br>165, கின்சி வீதி, கொழும்பு - 08.<br>165, Kynsey Road, Colombo - 08. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011-2696470 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2696470 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2689558 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2689558, 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

පැමිණිල්ලට අදාළව වගඋත්තරකාර මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිෂන් සභාව වෙත කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුගේ දරුවා 2017 වර්ෂයේ පළමු වසරට ඇතුළත් කිරීමට සහෝදර ගණය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවත්,

අදාළ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ පැමිණිලිකරු එහිදී ලකුණු 68 ක් උපයාගෙන ඇති බවත්, නමුත් චක්‍රලේඛනය අනුව අයදුම්කරුගේ පදිංචිය තහවුරු කිරීමට ඉදිරිපත් කර ඇත්තේ මහනුවර නගර සභාවෙන් ලබාගත් ලිපියක් බවත්, එය හිමිකම් ඔප්පුවක් සේ පිළිගත නොහැකි නිසා පැමිණිලිකරුගේ නම අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය අනුව තෝරාගත් ලේඛනයෙන් ඉවත් කළ බවත්ය.

නිරීක්ෂණය :-

පැමිණිලිකරු සිය දරුවා 2017 වර්ෂයේ මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කර ගැනීම සඳහා සහෝදර ගණය යටතේ අයදුම්කර සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ඇති අතර, ලකුණු 68 ක් ලබාගෙන ඇති නමුත් අවසන් තේරීම් ලේඛණයට නම ඇතුළත් කර නොමැත. වගඋත්තර පාර්ශවීය කිංස්වුඩ් විද්‍යාලය මගින් පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති වාර්තාවේ සඳහන් වන්නේ පැමිණිලිකරු පදිංචි ස්ථානයේ හිමිකම් තහවුරු කර නොමැති බැවින් තෝරාගෙන නොමැති බවයි.

පැමිණිලිකරු විසින් හිමිකම තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇත්තේ මහනුවර මහනගර සභාව මගින් නිකුත් කර ඇති 2016.06.09 දිනැති ලිපියක් වන අතර, එමගින් පැමිණිලිකරු අදාළ ලිපිනයේ පදිංචි බවත්, ඉඩම් සමීක්ෂණ ලැයිස්තුවේ අංක 110 යටතේ ලියාපදිංචි වී ඇති බවත්, ඉඩම නියමානුකූල කරනු ලබන බවත් දන්වා ඇත. ඒ අනුව අදාළ ස්ථානයේ හිමිකම පැමිණිලිකරුට ඇති බව තහවුරු වන බැවින් පැමිණිලිකරුගේ දරුවා කිංස්වුඩ් විද්‍යාලයට ඇතුළත් කර නොගැනීම පැමිණිලිකරුට සිදුකළ අගතියක් බව නිරීක්ෂණය වේ.

තවද පැමිණිලිකරුගේ වැඩිමහල් දරුවන් දෙදෙනා මේ වන විට මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ ඉගෙනුම ලබන අතර, අදාළ දරුවන් දෙදෙනා පාසලටඇතුළත් කර ගැනීමේදී පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇත්තේ ද මෙම මහනුවර මහනගර සභාව මගින් නිකුත් කර ඇති ලිපිලේඛනම බැවින් පැමිණිලිකරුට පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු වන බව සලකා මෙම දරුවාද පාසලට ඇතුළත් කළ යුතුව පැවැති බවද නිරීක්ෂණය වේ.

තවද, 17/2016 චක්‍රලේඛනයෙහි ලබාදී ඇති ලකුණු අවලංගු කර තේරීම් ලේඛනයෙන් නම ඉවත් කළ හැක්කේ පදිංචිය තහවුරු නොවන්නේ නම් පමණක් වන අතර හිමිකම් තහවුරු නොවේ නම් ලේඛනයෙන් ඉවත්කිරීමේ හැකියාවක් නොමැති බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

පැමිණිලිකරුගේ දරුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට සහෝදර ගණය යටතේ ඇතුළත් වීමට අවශ්‍ය ලකුණු ලබාගෙන තිබියදී පදිංචි ස්ථානයේ හිමිකම් තහවුරු නොවන බව සලකා කටයුතු කිරීම 17/2016 චක්‍රලේඛනය උල්ලංඝනය කිරීමක් වන අතර, අදාළ දරුවා පාසලට ඇතුළත් කර නොගැනීමෙන් වගඋත්තර පාර්ශවීය මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1)ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති "නීතිය පසිදළිය සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරුගේ දරුවා වන එච්.වී.එච්.ඒ කුමාර දරුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ 2019 වර්ෂයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

2019.06-21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මාන හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මාන හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත් :

1. අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා,
   අධ්‍යාපන අමාත්‍යංශය
   ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
   අධ්‍යාපන අමාත්‍යංශය
   ඉසුරුපාය, බත්තරමුල්ල.

B/